මගේ අංකය : PMO/ADM/1/1/1/1
දිනය : 2023.04. 06

සියලුම අංශ ප්‍රධානීන් වෙත

**<u>අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් පිටතට ස්ථාන මාරුවී යන නිලධරයන්ගේ තොරතුරු එවීම</u>**

අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් විවිධ ආයතන වෙත ස්ථාන මාරුවී යන නිලධරයන්ගේ පෞද්ගලික ලිපිගොනු ස්ථාන මාරුවීම් ලැබ සතියක් ඇතුළත අදාළ ආයතන ප්‍රධානින් වෙත යොමු කරන ලෙස අග්‍රාමාත්‍ය ලේකම්තුමා විසින් උපදෙස් ලබා දී ඇත.

02. ඒ අනුව එම නිලධරයන්ගේ පෞද්ගලික ලිපිගොනු ඔවුන් ස්ථාන මාරුවී ගිය අදාළ ආයතන වෙත යැවීමට හැකිවනු පිණිස පහත දක්වා ඇති තොරතුරු අතුරින් ඔබ අංශය වෙතින් ලබාදිය යුතු තොරතුරක් වේ නම් නිලධරයා ස්ථාමාරුවීම් ලැබ දින 03 ක් ඇතුළත එම තොරතුරු පාලන I අනු අංශය වෙත යොමු කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

i. නිලධරයාගේ නිවාඩු විස්තරය
ii. මෙම කාර්යාලයේ සේවය කරන ලද කාලයට අදාළව වැන්දඹු හා අනත්දරු දායක මුදල් අය කිරීම

03. මේ සම්බන්ධයෙන් ඔබ දක්වන කඩිනම් සහාය අගය කොට සලකමි.

ඩී මාශංක එච් ලියනගේ
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන 1) රා.ආ.
අග්‍රාමාත්‍ය ලේකම් වෙනුවට